# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## මධ්‍යම පළාත

### නුවරඑළියේ දිස්ත්‍රික් උසාවියේ නඩුශාලාවේදීය

උඩපුස්සැල්ලාවේ සැන්ට් මාග්‍රට්ස් කඩවීදියේ පදිංචි ඇල්. පී. සිරිසේන ............................................ පැමිණිලිකාරයා.

අංක : 4847. එදිරිව

උඩපුස්සැල්ලෑවේ සැන්ට් මාග්‍රට්ස් කඩවීදියේ පදිංචි පියදාස වීරසූරිය ................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් දේපොල ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත්, 1,072, 16 ක් ද රු. 1,000ට වර්ෂ 1960ක් වූ නොවැම්බර් මස 2 වැනි දින සිට 1962 ක්වූ ජූනි මස 15 වෙනි දින දක්වා සියයට හයේ පොලිය හා ගෙවා නිමවනතුරු සියයට පහේ පොලියත් එම මුදලෙන් විත්තිකරු ගෙවා ඇති රු. 80 ව අඩුකර ඉතුරු මුදල සහ පිස්කල් ගාස්තු හා අනිකුත් සියලුම වියදම් අයකර ගැනීමට, 1966 ක්වූ අගෝස්තු මස 20 වැනි දින (66.8.20) පෙරවරු 11 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

ශ්‍රී ලංකා දීපයේ මධ්‍යම දිසාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ උඩපළාත කෝරළේ සැන්ට් මාග්‍රට්ස් නැමති ගමේ පිහිටි ජී. ඊ. යූ. රත්නායක බඳුල්ලේ මිනින්දෝරු තැන විසින් මැන සාදනලද වර්ෂ 1955 ක්වූ පෙබරවාරි මස 7 වෙනි දින දාතමින් හා අංක 806 දරණ ප්ලෑනේ පෙනෙන උතුරට: අංක 24 දරණ කැබැල්ලද; නැගෙනහිරට: පාරද, ආණ්ඩුව සන්තක ඉඩම සහ අංක 27 දරණ කැබැල්ලද; දකුණට: අංක 26 දරණ කැබැල්ලද (කොටසක්); බස්නාහිරට: 24 සහ 28 දරණ කැබලිද මායිම් වන්නාවූ පර්චස් විසිහයක් සහ දශම අටයි දෙකක් (අ. 0, රු. 0, ප. 26.82)ක බිම් ප්‍රමානයෙන් යුත් බෙදා වෙන්කරන ලද බිම් කැබැල්ලෙන් සහ එහිතුළ තිබෙන ගොඩනැගිලි සහ සැම දෙයිනුත් නොබෙදූ තුනෙන් එක (1/3) පංගුවක් වෙත්. තවද ඉහතකී බෙදා වෙන්කරන ලද කැබැල්ල වර්ෂ 1949 ක්වූ අගෝස්තු මස 19 වෙනි දින දාතමින් එච්. සී. සිමින් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 209 ඒ. දරණ ප්ලෑනේ පෙනෙන අංක 26 දරණ කැබැල්ලෙන් බෙදා වෙන්කරනලද කැබැල්ල වෙත්.

ඒ. එම්. එම්. ෂෞකත්,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1966 ක්වූ ජූලි මස 3 දින,
නුවරඑළියේ නියෝජ්‍ය පිස්කල්,
කායභාලයේදීය.

7-1271

